**ජාතික ක්‍රීඩා අරමුදල - 2018**

**--------------------------------**

**1.1 මතය**

**-------**

ජාතික ක්‍රීඩා අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. \

ජාතික ක්රීඩා අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගනකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.5.1 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම
------------------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1973 අංක 25 දරන ජාතික ක්‍රීඩා පනතේ 25 (2) වගන්තිය | අමාත්‍යාංශ ලේකම් විසින් එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මණින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | 2016 වර්ෂයේ පාලන වාර්තාව සකස් කර ඇති අතර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් වාර්තා මුද්‍රණය සඳහා ප්‍රසම්පාදන කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත. 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | ජාතික ක්‍රීඩා පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් වී නොතිබුණු මාස 6 කට වැඩි කාලයක් ඉක්වමූ රු.4,121,664 ක් වටිනා චෙක්පත් 108 ක් සම්බන්ධයෙන් අදාළ රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර විවිධ තැන්පත් ගිණුමේ චෙක්පත් 102 ක් හා බැංකු සැසඳුම් ප්‍රකාශයේ චෙක්පත් 06 ක් ඇතුළත් කර තිබුණි. | තැන්පතු ගිණුමේ රඳවා ඇති මුදල අප්‍රේල් මාසයේදී මාරු පත්‍ර මගින් ආදායම වෙත මාරු කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 396 (ඇ) හි දැක්වෙන පරිදි ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.26,110,110 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,824,605 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,285,505 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආයෝජන මත පොලී රු.1,142,533 කින් අඩුවීම, ජාතික ලොතරැයි මණ්ඩලයේ ලැබීම් රු.2,901,879 කින් අඩුවීම, රජයේ ප්‍රදාන රු.8,000,000 අඩුවීම, දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයේ ආදායම රු.2,168,910 කින් අඩුවීම, ජාත්‍යන්තර තරඟ සඳහා වියදම් රු.3,766,320 කින් වැඩිවීම, විවිධ වියදම් රු.2,399,898 කින් වැඩිවීම සහ දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයේ වියදම රු.3,898,011 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 84 වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රීඩා අරමුදල විසින් කරනු ලබන ආයෝජන සඳහා ලැබෙන පොලී රඳවා ගැනිමේ බද්දෙන් නිදහස් බවට නිෂ්කාශන ලිපියක් ලබා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 4 කදී රු.432,645 ක රඳවා ගැනීමේ බදු ගෙවා තිබුණි. | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 84 වගන්තිය ප්‍රකාරව රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් බවට නිෂ්කාශන ලිපියක් ලබා ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 84 වගන්තිය ප්‍රකාරව රඳවා ගැනීමේ බදු නිදහස් බවට නිෂ්කාශන ලිපියක් ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන මාණ්ඩලික නිලධාරීන් 4 දෙනෙකුට අරමුදල මගින් ක්‍රීඩා පුහුණුකරු දිමනා වශයෙන් රු.1,185,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද, එම නිලධාරීන් 4 දෙනා වෙත ක්‍රීඩා පුහුණුකරු දීමනා ගෙවීමේදී ඔවුන්ගේ කාර්යසාධනය සම්බන්ධ ඇගයීමක් සිදු කර නොතිබුණි. තවද ඉහත නිලධාරීන් 4 දෙනාගෙන් දෙදෙනෙකු සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය බර ඉසිලීමේ තරඟාවලියේ ක්‍රීඩා පුහුණුකරුවන් වශයෙන් තරඟ ජයග්‍රහනය වෙනුවෙන් රු.1,600,000 ක මුදලක් අරමුදලෙන් ගෙවා තිබුණි. | එම නිලධාරීන්ට ලේකම්තුමාගේ අනුමැතිය මත ගෙවීම් සිදුකර ඇති අතර ඉදිරියේදී ආයතන සංග්‍රහයේ 1.4.1 කෙරෙහි අවධානය යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය නිලධාරීන්ට මේ ආකාරයේ ගෙවීම් කිරීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25 (1) වගන්තිය ප්‍රකාරව අරමුදල අමාත්‍යාංශ ලේකම් විසින් පරිපාලනය කළ යුතු වුවත්, ඒ සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදි ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | අරමුදලේ පරිපාලන කටයුතු විධිමත්ව කරගෙන යාම සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ ආදායම රු. මිලියන 61.9 ක් හා වියදම රු.මිලියන 88 ක් වූ අතර අරමුදල සතුව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති වත්කම්වල එකතුව රු.මිලියන 139 ක් විය. මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක විය යුතු වූ නමුත් අරමුදල සඳහා අභ්යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණ අතර, අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති අභ්‍යන්තර විගණන ඒකකය මගින් හෝ විගණනයක් සිදු කර නොතිබුණි. | ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත දැනුම්දීමට කටයුතු කර මේ වසරේදි අභ්‍යන්තර විගණනය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුව ඇත. |

### 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අයවැය ගත වියදම් හා තථ්‍ය වියදම් සැසදිමේදී වැය විෂයයන් 13 කට අදාළව සියයට 19 සිට සියයට 346 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | පසුගිය වර්ෂයේ වැය කළ වියදම් හා ඉදිරි වර්ෂයට අපේක්ෂිත වියදම් පදනම්ව අයවැය පිළියෙල කිරීම් සිදුකර ඇති අතර, හැකි සෑම අවස්ථාවකදීම සාධාරණ පුරෝකථන අනුගමනය කර අයවැය පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | අයවැය ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර පාලන කාරකයන් ලෙස යොදා ගත යුතු අතර විචලනයන් පිළිබඳව කාලීනව සැලකිල්ලට ගත යුතුය. |